# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම)

**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම සඳහා ද; අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ ඔවුන් පිළිබඳව සොයා බැලීම සඳහා ද; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට සහාය වීම සඳහා ද; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ දත්ත සමුදයක් ස්ථාපනය කිරීම සඳහා ද; ඉහත කී කාර්යාලයට පවරනු ලබන බලතල හා කර්තව්‍යවලට අදාල කාර්යපටිපාටි සහ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා ද; මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ නැතහොත් ඊට ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

අග්‍රාමාත්‍යතුමා විසින් 2016 ජුනි මස 22 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 මැයි මස 27 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

[117 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 41.00 යි. තැපැල් ගාස්තුව : රු. 30.00 යි.

# අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම)

එල්. ඩී.—ඕ. 32/2016

**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම සඳහා ද; අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ ඔවුන් පිළිබඳව සොයා බැලීම සඳහා ද; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට සහාය වීම සඳහා ද; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ දත්ත සමුදයක් ස්ථාපනය කිරීම සඳහා ද; ඉහත කී කාර්යාලයට පවරනු ලබන බලතල හා කර්තව්‍යවලට අදාල කාර්යපටිපාටි සහ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා ද; මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ නැතහොත් ඊට ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

පැහැරගෙන යාමේ වින්දිතයන් වශයෙන් අතුරුදහන් වූ තැනැත්තන්, ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ තැනැත්තන් ඇතුළුව සටන්වල දී හෝ අන්‍යාකාරයකට සන්නද්ධ ගැටුම්වලට අදාලව අතුරුදහන් වූ තැනැත්තන්, දේශපාලන නොසන්සුන්තා සහ සිවිල් කැරළි කෝලාහලවල දී අතුරුදහන් වූ තැනැත්තන් ඇතුළු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සිදුවීම් ඇති හෙයින් ද;

අතුරුදහන් වූ තැනැත්තන් එසේ අතුරුදහන් වූ අවස්ථානුගත කරුණු පිළිබඳව සහ ඔවුන්ගේ ඉරණම සහ ඔවුන් සිටින ස්ථාන පිළිබඳව දැනගැනීමට අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට හිමිකම ඇති හෙයින් ද;

අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ ඔවුන් පිළිබඳව සොයා බැලීමට අවශ්‍ය සියලු පියවර ගැනීම සඳහා ද අතුරුදහන් වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ බැඳියා ආරක්ෂා කිරීම සඳහා ද මෙවැනි සිදුවීම් නැවත සිදුවීම වැළැක්වීම සඳහා ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම අවශ්‍ය බවට හඳුනාගෙන ඇති බැවින් ද;

දැන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. (1) මේ පනත 2016 අංක    දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි

මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

**2.** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පිළිබඳ පනතේ අරමුණු වනුයේ :-

(අ) අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ ඔවුන් පිළිබඳව සොයා බැලීම සඳහා උචිත යාන්ත්‍රණ පිහිටුවීම සහ එම තැනැත්තන් අතුරුදහන් වූ අවස්ථානුගත කරුණු සහ ඔවුන්ගේ ඉරණම පැහැදිලි කර ගැනීම;

(ආ) මේ පනතේ අර්ථානුකූලව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සිද්ධීන් අඩු කිරීම සඳහා අදාල බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමට;

(ඇ) මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි අතුරුදහන් වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ බැඳියා ආරක්ෂා කිරීම සඳහා ද; සහ

(ඈ) අතුරුදහන් වූ තැනැත්තන් හෝ ඔවුන්ගේ ඥාතීන්ට ප්‍රවේශ විය හැකි සහන ලබා ගැනීමේ නිසි මාර්ග හඳුනාගැනීමට,

අවශ්‍ය සියලු පියවර ගනු ලබන බවට සහතික වීම වේ.

## I වන කොටස

### අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (ඕ.එම්.පී.) පිහිටුවීම.

**3.** (1) (මෙහි මින්මතු "ඕ.එම්.පී." යනුවෙන් සඳහන් කරනු ලබන) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නම් වූ කාර්යාලයක් පිහිටුවනු ලැබේ.

(2) ඕ.එම්.පී. ය අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් වන අතර එහි සංස්ථාපිත නාමයෙන් ද එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) ඕ.එම්.පී. හි ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා තිබිය යුතු ය. ඕ.එම්.පී. හි කාර්යාභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාවක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කලින් කල පිහිටුවනු ලැබිය හැකි ය.

ඕ.එම්.පී. හි සංස්ථාපනය සහ එහි සංයුතිය.

**4.** (1) (අ) ඕ.එම්.පී. ය සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එම සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) ඕ.එම්.පී. හි සාමාජිකයන් අතරෙන් එක් සාමාජිකයෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා ලෙස පත් කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් සලකා බැලීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නම් එකකට වැඩි ප්‍රමාණයක් නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(2) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට සාමාජිකයන් පත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත යුතු ය :-

(අ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සංයුතිය මගින් ශ්‍රී ලාංකික සමාජයේ ඇති බහුත්ව ස්වභාවය පිළිබිඹුවන බවට වගබලා ගැනීමේ ප්‍රයත්නය;සහ

(ආ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්, සිද්ධිමය කරුණු සෙවීම හෝ විමර්ශනය සිදු කිරීම, මානව හිමිකම් නීතිය ජාත්‍යන්තර මානුෂීය නීතිය, මානව ප්‍රතිචාර පිළිබඳ පූර්ව පළපුරුද්දක් සහිත හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කර්තව්‍ය ඉටු කිරීමට අදාල වෙනත් සුදුසුකම් සහිත තැනැත්තන් විය යුතු බව.

ඕ.එම්.පී.හි සභාපතිවරයා සහ සාමාජිකයන්.

**5.** (1) ඕ.එම්.පී. හි සභාපතිවරයා සහ සාමාජිකයන් පත්කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ ලැබී දින දාහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින් එම තනතුරුවලට අදාල පත්වීම් සිදුකළ යුතු ය.

(2) නියමිත දින දාහතරක කාලය ඇතුළත අවශ්‍ය පත්වීම් සිදුකිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වන අවස්ථාවක එම කාලසීමාව අවසන් වීමේ දින සිට බලපවත්වන පරිදි –

(අ) ඕ.එම්.පී. හි සාමාජිකයන් ලෙස පත්කිරීමට නිර්දේශ කරනු ලැබූ තැනැත්තන් ඕ.එම්.පී. හි සාමාජිකයන් ලෙස පත් කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) සභාපතිවරයා වශයෙන් පත් කිරීමට නිර්දේශ කරනු ලැබ ඇති නම් ලැයිස්තුවේ මුලින් ම නම ඇති තැනැත්තා ඕ.එම්.පී. හි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(3) ඕ.එම්.පී. හි සභාපතිවරයා එම කාර්යාලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

**6.** ඕ.එම්.පී. හි සෑම සාමාජිකයෙක් ම එම කාලසීමාව අවසන්වීමට පෙර තම ධුරය අත්හරිනු ලැබුවහොත් මිස අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

සාමාජිකයන් ඉවත් කිරීම.

**7.** (1) (3) උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබීම හැර, වෙනත් ක්‍රමයකින් තම ධුරය අත්හරින සාමාජිකයකුට තවත් අවුරුදු තුනක කාලයක් සඳහා පමණක් නැවත පත්කිරීම සඳහා සලකා බලනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය:

එසේ වුව ද, කිසිම තැනැත්තකු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයකු ලෙස ධුර කාල දෙකකට වඩා පත් කරනු ලැබීමට හිමිකම් නොලැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාමාජිකයකු, වැඩ බැලීමේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබූ කාලසීමාව මේ උපවගන්තියේ අර්ථානුකූලව ධුර කාලයක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) සාමාජිකයකුගේ ධුරය:-

(අ) එම සාමාජිකයා මියයාමේ දී;

(ආ) ජනාධිපතිවරයා අමතන ලිපියක් මගින් එම සාමාජිකයා ධුරයෙන් ඉල්ලා අස්වීමේ දී;

(ඇ) මෙහි (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක් මත එම සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබීමේ දී;

(ඈ) එම සාමාජිකයාගේ ධුරකාලය අවසන්වීමේ දී,

එම ධුරය හිස් වන්නේ ය.

(3) ඕ.එම්.පී. හි සාමාජිකයකු:-

(අ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් එම සාමාජිකයා බුන්වත් පුද්ගලයකු බවට විනිශ්චය කරනු ලැබුවහොත්;

(ආ) අගමැතිවරයා විසින් කථානායකවරයා සහ විපක්ෂ නායකවරයා විමසා කරනු ලබන නිර්දේශයක් මත ජනාධිපතිවරයාගේ මතය අනුව එම සාමාජිකයාට ඕ.එම්.පී. හි සාමාජිකයකු ලෙස ද තම කාර්ය ඉටු කිරීමේ දී බැඳියා පිලිගැටුමක් ඇති බවට තීරණය කරනු ලැබුවහොත්;

(ඇ) මානසික හෝ ශාරීරික අශක්නුතාවක් තිබීමේ හේතුව මත එම සාමාජික ධුරයේ කටයුතු කිරීමට එම තැනැත්තා නුසුදුසු වන්නේ නම්;

(ඈ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් එම තැනැත්තා සිහිවිකල් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඉ) චරිත දූෂණාත්මක කරුණු ඇතුළත් වරදකට එම තැනැත්තා වරදකරු වී ඇත්නම්;හෝ

(ඊ) ඕ.එම්.පී. හි පූර්ව අනුමතය ලබා නොගෙන නොකඩවා එම කාර්යාලයේ රැස්වීම් තුනකට නොපැමිණ සිටියහොත්,

ජනාධිපතිවරයා විසින් එම සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) ජනාධිපතිවරයා අමතන ලිපියක් මගින් සභාපතිවරයාට සිය සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය ඔහු ඕ.එම්.පී. හි සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

(6) (අ) රෝගාතුරවීම හෝ වෙනත් අශක්නුතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා ඕ.එම්.පී. හි සභාපතිවරයාට තාවකාලිකව තම ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, සභාපතිවරයා වෙනුවෙන් වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) රෝගාතුරවීම හෝ වෙනත් අශක්නුතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ඕ.එම්.පී. හි සාමාජිකයකුට තාවකාලිකව තම ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, එම සාමාජිකයා වෙනුවෙන් වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් වෙනත් යම් පුද්ගලයකු පත් කරනු ලැබිය හැකි ය.

(ඇ) 4 (1) වන සහ 5 වන වගන්තිවල විධිවිධාන සභාපතිවරයා වශයෙන් හෝ සාමාජිකයකු වශයෙන් වැඩ බැලීම සඳහා පත් කරනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් අදාල විය යුතු ය.

(7) ඕ.එම්.පී. හි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එම සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කිසිදු ක්‍රියාවක් හෝ නීති කෘත්‍යයක් අවලංගු වන බවට සලකනු නොලැබිය යුතු ය.

ඕ.එම්.පී. හි රැස්වීම්.

8. (1) සභාපතිවරයා එම කාර්යාලයේ සියලු රැස්වීම්වල දී මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ

නොසිටියහොත්, ඕ.එම්.පී. හි සාමාජිකයන් විසින් එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් අතරින් එක් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරාපත් කර ගනු ලැබිය යුතු ය.

(2) ඕ.එම්.පී. හි සභාපතිවරයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව ඕ.එම්.පී. හි රැස්වීම් පැවැත්වීම සහ එම රැස්වීම්වල දී කටයුතු කිරීම යන කරුණු සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

ගණපූර්ණය.

**9.** ඕ.එම්.පී. හි රැස්වීම් සඳහා ගණපූර්ණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

## **II** වන කොටස

### ඕ.එම්.පී.හි බලතල, කාර්ය සහ කාර්යභාරය

ඕ.එම්.පී. හි කාර්යභාරය.

**10.** (1) ඕ.එම්.පී. ට පහත දැක්වෙන කාර්යභාරය ඇත්තේ ය :-

(අ) අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ සොයා බැලීම සහ ඒ සඳහා උචිත යාන්ත්‍රණ හඳුනාගැනීම සහ එම තැනැත්තන් අතුරුදහන් වූ අවස්ථානුගත කරුණු සහ ඔවුන්ගේ ඉරණම පැහැදිලි කිරීම;

(ආ) අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ සිදුවීම් පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාල බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි අතුරුදහන් වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ බැඳියා ආරක්ෂා කිරීම;

(ඈ) අතුරුදහන් වූ තැනැත්තන්ට සහ ඔවුන්ගේ ඥාතීන්ට ලබා ගැනීමට හිමිකම් ඇති සහන මාර්ග හඳුනාගැනීම සහ එවැනි මාර්ග පිළිබඳව එම අතුරුදහන් වූ තැනැත්තන්ට (ජීවත්ව සිටිය දී සොයාගනු ලැබුවහොත්) හෝ ඥාතීන්ට දැනුම් දීම;

(ඉ) වෙනත් ආයතන, සංවිධාන, රජයේ දෙපාර්තමේන්තු සහ පරීක්ෂණ කොමිෂන් සභා සහ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා විසින් දැනට සිදු කරනු ලබන හෝ ඊට කලින් සිදු කරන ලද ක්‍රියාමාර්ග මගින් ලබාගන්නා අතුරුදහන් වූ තැනැත්තන්ට අදාල දත්ත එකතු කිරීම සහ මේ පනත යටතේ පිහිටුවනු ලැබූ දත්ත සමුදයට එම තොරතුරු මධ්‍යගත කිරීම පිණිස ලබා දීම;

(ඊ) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෙනත් සියලු ක්‍රියාවන් සිදු කිරීම.

(2) යම් තැනැත්තකු අතුරුදහන් වී ඇති කාලසීමාව නොතකා ''අතුරුදහන් වූ තැනැත්තන්'' පිළිබඳ කාර්යාලයේ කාර්යභාරය අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් අදල විය යුතු ය.

11. ඕ.එම්.පී. ට පහත දැක්වෙන සාමාන්‍ය බලතල තිබිය යුතු ය:- ඕ.එම්.පී. හි සාමාන්‍ය බලතල.

(අ) තොරතුරු ලබා ගැනීමේ දී සහාය ලබා ගැනීමේ කාර්යය සඳහා; තාක්ෂණික සහාය සහ පුහුණුව (අධිකරණ වෛද්‍ය හෝ අන්‍යාකාරයකින් වන) ලබා ගැනීම සහ සහයෝගය ලබා ගැනීමේ කාර්ය සඳහා; පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් දත්ත සමුදයක් පිහිටුවීමේ කාර්ය සඳහා සහ තොරතුරුවල රහස්‍යභාවය සම්බන්ධයෙන්, ගිවිසුම්වලට ඇතුළත් වීම ඇතුළුව දේශීය වශයෙන් හෝ විදේශීය සහ සංස්ථාගත කරන ලදුව හෝ එසේ නොමැති සංවිධානයක් හෝ යම් තැනැත්තකු සමග අවශ්‍ය යයි ඕ.එම්.පී. ට පෙනී යන අවස්ථාවල දී ගිවිසුම්වලට ඇතුළත්වීම;

(ආ) ඕ.එම්.පී. ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා රීති සෑදීම;

(ඇ) ඕ.එම්.පී. හි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට අදාලව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සියලු කාර්යමණ්ඩලය විසින් අනුගමනය කළ යුතු ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී ප්‍රතිපත්ති ඇතුළු රීති සහ මාර්ගෝපදේශ කලින් කල නිකුත් කිරීම;

(ඈ) කාර්ය මණ්ඩලය සහ උපදේශකයන් පත් කිරීම සහ සේවයෙන් නෙරපීම සහ රජයේ සේවකයන්, ඕ.එම්.පී. ට ද්විතීයනය කිරීම සඳහා ඉල්ලා සිටීම;

(ඉ) මේ පනතේ විශේෂයෙන් සඳහන් ඒකක සහ අංශවලට අමතරව ඕ.එම්.පී. හි මනා පරිපාලනය සහ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය කමිටු සහ/හෝ අංශ සහ/හෝ ඒකක කලින් කල පිහිටුවීම සහ එම කාර්යාලයේ බලතල සහ කර්තව්‍ය එම කමිටුවලට අංශවලට සහ ඒකකවලට පවරාදීමේ බලය.

විමර්ශනය කිරීමේ බලතල.

**12.** ඕ.එම්.පී. ට පහත දැක්වෙන විමර්ශන බලතල ඇත්තේ ය:-

(අ) යම් අතුරුදහන් වූ තැනැත්තකු එසේ අතුරුදහන් වීමේ කාලසීමාව නොතකා එම තැනැත්තාට අදාල පැමිණිලි යම් අතුරුදහන් වූ තැනැත්තකුගේ ඥාතියකුගෙන් හෝ වෙනත් යම් තැනැත්තකු හෝ සංවිධානයකින් ලබා ගැනීම;

(ආ) ඕ.එම්.පී. ට කරන ලද පැමිණිල්ලක් මත හෝ කලින් පිහිටුවන ලද පරීක්ෂණ කොමිෂන් සභාවලින්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කොමිෂන් සභාවලින් හෝ අතුරුදහන්වීම හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව චෝදනා හෝ විභාගකළ කොමිෂන් සභාවලින් ලැබුණ තොරතුරු මත පරීක්ෂණ ආරම්භ කිරීම සහ එම තැනැත්තා සිටින ස්ථානය පිළිබඳව විමර්ශනයක් කිරීම සහ/හෝ යම් අතුරුදහන් වූ තැනැත්තකු අතුරුදහන්වීමේ අවස්ථානුගත කරුණු පිළිබඳව පරීක්ෂණයක් සහ/හෝ විමර්ශනයක් කිරීම:

එසේ වුව ද, ඕ.එම්.පී. විසින් පහත සඳහන් සිද්ධිවලට ප්‍රමුඛත්වය ලබා දිය හැකි ය :-

(i) ඉතා මෑතක දී සිදු වූ පුද්ගලයන් අතුරුදහන් වීම පිළිබඳ සිද්ධීන්;

(ii) දැනටමත් වැදගත් සාක්ෂි තිබෙන සිද්ධීන්;

(iii) ඕ.එම්.පී. හි මතය අනුව මහජනතාවට වැදගත් වන සිද්ධීන්.

(ඇ) පහත දැක්වෙන පියවර ඇතුළත්ව එහෙත් ඒවාට සීමා නොවන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමට පියවර ගැනීම:-

(i) වීඩියෝ සාකච්ඡා පහසුකම් භාවිත කිරීම ඇතුළුව ලිඛිත හෝ වාචික ප්‍රකාශ ලබා ගැනීම සහ තැනැත්තන්ගෙන් සාක්ෂි ලබා ගැනීම;

(ii) ප්‍රකාශයක් ලබාදීම සඳහා හෝ ඔහුගේ සන්තකයේ ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම සඳහා ඕ.එම්.පී. ට පැමිණෙන ලෙස ශ්‍රී ලංකාවේ සිටින හෝ පදිංචි යම් තැනැත්තකු කැඳවීම;

(iii) සාක්ෂි ආඥා පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී ලිඛිත හෝ වාචික ආවේශ කළ නොහැකි යම් ප්‍රකාශයක් හෝ ලේඛනයක් පිළිගැනීම;

(iv) වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ පෞද්ගලික ආරක්ෂාව සහතික වීම සඳහා උපකාරීවීමට අවශ්‍ය අවස්ථාවල දී රහස්‍යභාවයෙන් ලබා දෙන තොරතුරු භාර ගැනීමේ ක්‍රියාවලියක් සකස් කිරීම;

(v) රහස්‍යභාවය පිළිබඳ කොන්දේසි මත තොරතුරු භාරගැනීම ක්‍රියාවලියක් සකස් කිරීම.

(ඈ) සැක සහිත මිනීවලවල් හෑරීම සහ/හෝ මිනිය ගොඩ ගැනීම සඳහා අධිකරණ ආඥාවක් ලබා ගැනීමට ප්‍රාදේශීය අධිකරණ බලය ඇති උචිත මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට සහ එකී කැණීම් කටයුතුවල දී හෝ මිනිය ගොඩ ගැනීමේ දී සහ ඉන් පසුව සිදුවන වෙනත් නීති කෘත්‍යවල දී නිරීක්ෂකයකු ලෙස ක්‍රියා කිරීම;

(ඉ) මෙම කාර්යාලයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා යම් රජයේ ආණ්ඩුවේ, පළාතේ හෝ පළාත් පාලන ආයතනයකින් හෝ නියෝජ්‍ය ආයතනයකින් නැතහොත් එහි සේවයෙහි නියුක්ත යම් සේවකයකුගෙන් අවශ්‍ය සහාය ඉල්ලා සිටීම, වෙනත් යම් ලිඛිත නීතියක හෝ එය යටතේ සාදන ලද නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද ඕ.එම්.පී. මගින් සහාය සඳහා ඉල්ලීමක් කරනු ලබන එවැනි යම් අධිකාරියක්, නියෝජ්‍යායතනයක් හෝ නිලධරයකු විසින් වහාම එම සහාය ලබාදිය යුතු ය. එම සහායට එම අධිකාරියේ, නියෝජ්‍යායතනයේ හෝ

නිලධරයාගේ සන්තකයේ ඇති තොරතුරු ඉදිරිපත් කිරීම සහ ලේඛන ඉදිරිපත් කිරීම ඇතුළත්වන අතර එහෙත් ඒවාට සීමා නොවේ;

(ඊ) රජය විසින් හෝ යම් රාජ්‍ය ආයතනයක් විසින් හෝ යම් රාජ්‍ය නිලධරයකු විසින් යම් තැනැත්තකු රඳවා තබාගෙන ඇති බවට හෝ කලින් රඳවා තබාගෙන සිටි බවට සැක කරනු ලබන යම් රඳවා තබා ගැනීමේ ස්ථානයකට, පොලිස් ස්ථානයකට, බන්ධනාගාරයකට හෝ වෙනත් යම් ස්ථානයකට දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ ඕනෑම වේලාවක දී වරෙන්තුවක් නොමැතිව ඇතුළු වී විමර්ශනය කිරීමට සහ ඕ.එම්.පී. විසින් පවත්වනු ලබන යම් විමර්ශනයක කාර්යය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් ද්‍රව්‍යයක් පරීක්ෂා කිරීමට සහ එහි පිටපත් හෝ උධෘත ලබා ගැනීමට, තහනමට ගැනීමට සහ රඳවා තබා ගැනීමට ඕ.එම්.පී. හි යම් නිශ්චිත නිලධරයකුට බලය පැවරීම;

(උ) ඕ.එම්.පී. විසින් පවත්වනු ලබන යම් විමර්ශනයකට අදාල සාක්ෂි ඇති බවට සැක කරනු ලබන යම් පරිශ්‍රයක් පරීක්ෂා කිරීමට යම් පෙලිස් නිලධරයකුගේ හෝ ඕ.එම්.පී. හි යම් නිශ්චිතව නිලධරයකුට හැකිවන පරිදි සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සහ ඕ.එම්.පී. විසින් පවත්වනු ලබන යම් විමර්ශනයක කාර්ය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන එම එම ස්ථානයේ යම් ද්‍රව්‍යයක් පරීක්ෂා කිරීමට සහ එහි පිටපත් හෝ උධෘත ලබා ගැනීමට, තහනමට ගැනීමට සහ රඳවා තබා ගැනීමට;

(ඌ) මේ පනතේ අර්ථ නිරූපනය කර ඇති පරිදි "අතුරුදහන් වූ තැනැත්තන්" යන යෙදුමේ අර්ථ නිරූපනය තුළට නොවැටෙන ඕ.එම්.පී. වෙත ඉදිරිපත් කර ඇති අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සියලු පැමිණිලි පැමිණිලිකරු සමග නිසි පරිදි සාකච්ඡා කිරීමෙන් පසු පොලිසිය වෙත හෝ නීතිය ක්‍රියාත්මක කරන වෙනත් අදාල බලධරයකු වෙත යොමු කිරීම; සහ

(එ) දණ්ඩ නීති සංග්‍රහයේ හෝ වෙනත් යම් නීතියක අර්ථානුකූලව වූ ද විමර්ශනය කළ යුතු වූ ද යම් වරදක් සිදු කර ඇති බවට ඕ.එම්.පී. ට පෙනී යන අවස්ථාවක

ඕ.එම්.පී. විසින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන් සමග අවශ්‍ය යයි සලකනු ලබන සාකච්ඡා කිරීමෙන් පසු වින්දිතයන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ සහ සමාජයේ උපරිම යහපත සැලකිල්ලට ගෙන එම කරුණ පිළිබඳව අදාළ නීතිය ක්‍රියාවේ යෙදවීමේ ආයතනයට හෝ නඩු පැවරීමේ ආයතනයට වාර්තා කරනු ලැබිය හැකි ය. එම වාර්තාව මගින් අතුරුදහන් වූ තැනැත්තාගේ සිවිල් තත්ත්වයට අදාල තොරතුරු (එනම් අතුරුදහන් වූ තැනැත්තාගේ නම, වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය ආදී තොරතුරු) සහ අතුරුදහන් වූ තැනැත්තා අවසන් වරට දකිනු ලැබූ ස්ථානය/ස්ථාන හෝ දිස්ත්‍රික්කය/දිස්ත්‍රික්ක සහ ඊට අදාල දිනයන් සඳහන් කළ යුතු ය:

එසේ වුව ද සාක්ෂිකරුවකු කැමතිවන අවස්ථාවක දී විමර්ශන ක්‍රියාවලියේ දී භාවිත කිරීම සඳහා එම සාක්ෂිකරුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට අදාල ආයතනයට හැකි වන පරිදි එම සාක්ෂිකරු පිළිබඳ විස්තර ඕ.එම්.පී. විසින් අදාල බලධරයාට දැනුම් දිය හැකි ය.

ඕ.එම්.පී. හි කාර්ය සහ කර්තව්‍ය.

13. (1) ඕ.එම්.පී. වෙත පහත දැක්වෙන කාර්තව්‍ය පැවරී ඇත:-

(අ) (i) විමර්ශනයක් පැවැත්වෙන අතරතුර පැමිණිල්ල අදාල වන තැනැත්තා අතුරුදහන් වූ තැනැත්තකු බවට තීරණය කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ප්‍රමාණවත් සාක්ෂි ඇති අවස්ථාවක දී දක්නට නොමැති බවට වූ සහතිකයක් (Certificate of Absence) නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට හැකිවන පරිදි ඕ.එම්.පී. විසින් එසේ අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතියා වෙත අතුරු වාර්තාවක් නිකුත් කළ යුතු ය;

(ii) විමර්ශනය අවසන් වීමෙන් පසු පැමිණිල්ල අදාළවන තැනැත්තා අතුරුදහන් වූ තැනැත්තකු බවට හෝ මියගිය තැනැත්තකු බවට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි, දක්නට නොමැති බවට වූ සහතිකයක් හෝ මරණ සහතිකයක් නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට හැකිවන පරිදි ඕ.එම්.පී. විසින් එම අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතියා වෙත වාර්තාවක් නිකුත් කරනු ලැබිය යුතු ය;

(iii) අතුරු වාර්තාවක හෝ වාර්තාවක වාර්තාගත කර ඇති නිගමනය වැරදි සහගත බවට තවදුරටත් වූ විමර්ශනවලින් හෙළිදරව් වන අවස්ථාවක දී ඕ.එම්.පී. විසින් ඒ බව ඥාතියා ට දැනුම් දිය යුතු අතර, එකී නව තත්ත්වය පිළිබඳව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ද සමගාමීව දැනුම් දිය යුතු ය;

(iv) අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතියකුට අතුරු වාර්තාවක්, වාර්තාවක් හෝ තොරතුරු ලබා දීමේ දී ඥාතීන් අතර ප්‍රමුඛතා අනුපිළිවෙළ මෙහි 27 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අනුපිළිවෙළට අනුව විය යුතු ය;

(v) අතුරු වාර්තා සහ වාර්තා නිකුත් කළ යුත්තේ 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත ක්‍රියාත්මක වන කාලය තුළ දී හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් දක්නට නොමැති බවට වූ සහතික නිකුත් කිරීමට අවසර ලබාදෙන වෙනත් යම් නීතියක් ක්‍රියාත්මක වන කාලය තුළ දී එවැනි සහතික නිකුත් කිරීමට පහසුකම් සැලසීමේ කාර්ය සඳහා පමණි.

(ආ) යම් අතුරුදහන් වූ තැනැත්තකු ජීවත්ව සිටින බවට සොයා ගනු ලැබුවහොත්, එම තැනැත්තා සිටින ස්ථානයට අදාල තොරතුරු ලබා දීමට ඕ.එම්.පී. ට හැකියාව ඇති අවස්ථාවල දී ජීවත්ව සිටිය දී සොයාගනු ලැබූ එම අතුරුදහන් වූ තැනැත්තාගේ කැමැත්තට යටත්ව එම තොරතුරු අතුරුදහන් වූ තැනැත්තාගේ යම් ඥාතියකුට හෝ වෙනත් යම් පැමිණිලිකරුවකුට ලබා දීම;

(ඇ) අතුරුදහන් වූ තැනැත්තකුට අදාලව සිදු වෙමින් පවතින විමර්ශනයක පවතින තත්ත්වයට අදාල තොරතුරු එම තැනැත්තාගේ ඥාතීන්ට ලබාදීම මගින් පවතින විමර්ශනයට හානි සිදු විය හැකි බව හෝ එය අතුරුදහන් වූ තැනැත්තාගේ උපරිම යහපත සඳහා නොවන බව ඕ.එම්.පී. හි මතය වන්නේ නම් මිස, එසේ අතුරුදහන් වූ තැනැත්තාට අදාල විමර්ශනයේ තත්ත්වය පිළිබඳ තොරතුරු අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට ලබා දීම:

එසේ වුව ද, අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතීන් මියගොස් ඇති අවස්ථාවක හෝ එම ඥාතීන් පිළිබඳව ඕ.එම්.පී. නොදන්නා අවස්ථාවක හෝ එම ඥාතීන් සොයා ගැනීමට නොහැකි වන අවස්ථාවක, ඕ.එම්.පී. විසින් එම විමර්ශනයට අදාල යාවත්කාලීන තොරතුරු එම කාර්යාලය විසින් උචිත බලධරයකුට හෝ සංවිධානයකට ලබා දිය හැකි ය.

(ඈ) විමර්ශනයක් අවසන්වීමේ දී 15 (1) වගන්තියේ විධිවිධානවලට යටත්ව -

(i) අතුරුදහන් වූ තැනැත්තා මියගොස් ඇති අවස්ථාවක හෝ ඔහු සිටින ස්ථානය නොදන්නා අවස්ථාවක ඕ.එම්.පී. විසින් අවස්ථාවෝචිත පරිදි අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතීන්ට හෝ වෙනත් පැමිණිලිකරුවකුට අතුරුදහන් වූ අවස්ථානුගත කරුණු හා ඉරණම දැනුම් දිය යුතු ය;

(ii) අතුරුදහන් වූ තැනැත්තා සිටින ස්ථානය දන්නා අවස්ථාවක (ආ) ඡේදයට යටත්ව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් එම තැනැත්තා අතුරුදහන් වී ඇති අවස්ථානුගත කරුණු පිළිබඳව ඕ.එම්.පී. විසින් එම තැනැත්තාගේ ඥාතීන්ට දැනුම් දිය යුතු ය;

(ඉ) අවශ්‍ය අවස්ථාවල දී අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට මනෝ-සමාජීය සහාය ඇතුළු සුබසාධන සේවා හා පරිපාලන සහාය ලබාදීම හෝ ලබාදීමට පහසුකම් සැලසීම;

(ඊ) වන්දි ඇතුළු එහෙත් ඒවාට සීමා නොවන ආධාර අතුරුදහන් වූ තැනැත්තන්ට සහ/හෝ ඔවුන්ගේ ඥාතීන්ට ප්‍රදානය කරන ලෙස අදාල බලධාරීන්ට නිර්දේශ කිරීම සහ/හෝ ඔවුන්ට පරිපාලන සහාය සහ මනෝ - සමාජීය සේවා ඇතුළු සුභසාධන සේවා ලබාදෙන අදාල බලධාරීන් වෙත නිර්දේශ කිරීම;

(උ) වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා ක්‍රමවේදයක් සකස් කර එය ක්‍රියාත්මක කිරීම:

එසේ වුව ද 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව උචිත ආඥාවක් ඉල්ලා සිටීමට පාර්ශ්වයන්ට හෝ අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයට ඇති අයිතියට මෙහි සඳහන් විධිවිධාන මගින් අගතියක් සිදු නොවිය යුතු ය;

(ඌ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සියලු තොරතුරු ඇතුළත්වන දත්ත සමුදයන් සකස් කර එය කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම;

(එ) බරපතල අපරාධ අදාල නීතිය ක්‍රියාවේ යෙදවීමේ ආයතනවලට හෝ නඩු පැවරීමේ අධිකාරියට වාර්තා කිරීමේ අයිතිය ඇතුළු අදාල බලධාරීන්ට සෘජුවම කරුණු යොමු කිරීමේ අයිතිය පිළිබඳව සහ පරිපාලන සහාය සඳහා හිමිකම් ඉදිරිපත් කළ හැකි යාන්ත්‍රණයන් තිබීම පිළිබඳව වින්දිතයන්ට, ඥාතීන්ට, සාක්ෂිකරුවන්ට සහ ඕ.එම්.පී. ට තොරතුරු සපයන තැනැත්තන්ට දැනුම් දීම;

(ඒ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ එසේ අතුරුදහන්වීමට හේතු සහ එසේ අතුරුදහන් වී ඇති බව සහ එහි බලපෑම පිළිබඳව මහජනයා දැනුවත් කිරීම සහ අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ගේ අවශ්‍යතා සපුරාලීමට සහ ආර්ථික, මනෝ - සමාජීය, නීතිමය සහ පරිපාලන සහාය සඳහා ඔවුන්ට ප්‍රවේශවීමට පහසුකම් සැලසීමේ අවශ්‍යතාව පිළිබඳව මහජනමතය ගොඩනැගීමේ සහ ඒ සඳහා උචිත පියවර ගැනීම.

(ඔ) පහත දැක්වෙන කරුණුවලට අදාල නිර්දේශ ඇතුළු අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයේ කාර්යභාරය හා සම්බන්ධව අදාල බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම:-

(i) ඕ.එම්.පී. හි වැඩ කටයුතු අතරතුර දී හඳුනාගත් ක්‍රමවේද මත පදනම්ව අනාගත අතුරුදහන් වීම් වැළැක්වීම;

(ii) අනුස්මරණය කිරීමේ සහ පිළිදැනීමේ ක්‍රියා මාර්ග සහ ක්‍රමවේද;

(iii) හඳුනාගත නොහැකි මළසිරුරු පිළිබඳව සහ හඳුනාගත හැකි මළසිරුරු පිළිබඳව ක්‍රියා කරන ආකාරය;

(iv) අතුරුදහන් වූ තැනැත්තන්ගේ අතුරුදහන් වීමට අදාල අවස්ථානුගත කරුණු හෝ ඔවුන් සිටින ස්ථාන පැහැදිලිව දැනගත නොහැකි අවස්ථාවන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම;

(v) දත්ත පිළිබඳ රහස්‍යභාවයට සහ ඒවා ආරක්ෂා කිරීමට අදාල සියලු නීති පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් මහජනතාවගේ දැන ගැනීම සඳහා අතුරුදහන්වූවන්ගේ ප්‍රශ්න පිළිබඳ තොරතුරු පළ කිරීම;

(vi) අතුරුදහන් වූ තැනැත්තන්ට අදාල ජාතික මට්ටමේ නීති හා නියෝග සකස් කිරීම;සහ

(vii) වින්දිතයන්ගේ සහ අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ගේ සමාජීය සහ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීමට අදාල වන්දි ලබා දීම සහ මනෝ - සමාජීය සහාය සහ වෙනත් ක්‍රියා මාර්ග;

එසේ වුව ද, (ඔ) ඡේදය යටතේ නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී ඕ.එම්.පී. විසින් උචිත යයි සලකනු ලබන අවස්ථාවල දී, අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ගෙන් සහ/හෝ අතුරුදහන් වූ තැනැත්තන් නියෝජනය කරන සංවිධානවලින් අදහස් විමසිය හැකි ය.

(2) ඕ.එම්.පී. හි තීරණ මගින් යම් අපරාධ හෝ සිවිල් වගකීමක් ඇති නොවිය යුතු ය.

ඕ.එම්.පී.විසින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ සහ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහතික කිරීම.

**14.** මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් තැනැත්තකුගේ තත්ත්වය සැලකිල්ලට නොගෙන සහ කවර හෝ හේතුවක් මත වෙනස්කම් දැක්වීමකින් තොරව සමානාත්මතාවය මත අතුරුදහන් වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කරන බවට ඕ.එම්.පී. සහතික විය යුතු ය.

තොරතුරුවල රහස්‍යභාවය.

**15.** (1) යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඕ.එම්.පී. හි සෑම සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු සහ උපදේශකයකු මේ පනත යටතේ තම කාර්ය ඉටුකිරීමේ දී හැර

තමා වෙත රහසේ දැනුම් දෙන ලද කරුණු සම්බන්ධයෙන් එම තැනැත්තා විසින් රහස්‍යභාවය ආරක්ෂා කරමින් එසේ ආරක්ෂා කිරීමට ආධාර කළ යුතු ය. එම තොරතුරු සම්බන්ධයෙන් 2016 අංක දරන තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනතේ විධිවිධාන අදාල නොවිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන ඉටු කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවන් හි දී හැර මේ පනත යටතේ තම කාර්ය ඉටු කිරීමේ දී රහසිගතව තමා වෙත දැනුම් දී ඇති යම් කරුණක් යම් අධිකරණයකට හෝ වෙනත් ස්ථානයකට ඉදිරිපත් කරන ලෙස ඕ.එම්.පී. හි යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ උපදේශකයකුට නියම කරනු නොලැබිය යුතු ය.

(3) දත්ත සමුදයේ සහ දත්තවල ආරක්ෂාව සහතික කිරීම සඳහා තාක්ෂණික ආරක්ෂක ක්‍රමවේද ඇතුළු අවශ්‍ය සියලු පියවර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ගත යුතු ය.

## III කොටස

### ඕ.එම්.පී. හි ලේකම් කාර්යාලය, සෙවීමේ ඒකකය සහ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය

ඕ.එම්.පී.හි ලේකම් කාර්යාලය.

**16.** (1) ඕ.එම්.පී. ට ලේකම් කාර්යාලයක් තිබිය යුතු අතර, එම ලේකම් කාර්යාලය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ලේකම් කාර්යාලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධ වගකීම භාරව සිටිය යුතු ය.

(2) මේ පනතේ සඳහන් පරිදි ඕ.එම්.පී. ට බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී එම ඕ.එම්.පී. ට සහායවීම පිණිස අවශ්‍ය නිලධරයන් හා කාර්ය මණ්ඩලය ඕ.එම්.පී. විසින් පත් කරනු ලැබිය හැකි ය.

(3) (මේ පනත යටතේ තම කර්තව්‍ය ඉටු කිරීමේ සීමිත කාර්යය සඳහා) ඕ.එම්.පී. හි සාමාජිකයන් සහ එම කාර්යාලයේ නිලධාරින් සහ කාර්ය මණ්ඩලය (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ සහ අල්ලස් පනතේ සහ (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අල්ලස් පනතේ අර්ථානුකූලව ඕ.එම්.පී. "උපලේඛනගත ආයතනයක්" ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එම පනතේ විධිවිධාන තේරුම්ගත යුතු ය.

**ඕ.එම්.පී. හි සෙවීම් ඒකකය.**

**17.** (1) ඕ.එම්.පී. හි සෙවීම් ඒකකයක් තිබිය යුතු අතර, අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම හා ඔවුන් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා ද එම අතුරුදහන්වීම පිළිබඳ අවස්ථානුගත කරුණු පැහැදිලි කර ගැනීමේ දී ඊට සහාය වීම සඳහා ද එම අතුරුදහන් වූ තැනැත්තන් සිටින ස්ථාන සහ ඔවුන්ගේ ඉරණම පිළිබඳව සොයා බැලීම සඳහා ද එම සෙවීම් ඒකකය වගකිව යුතු ය.

(2) එම සෙවීම් ඒකකය ඕ.එම්.පී. මගින් පත් කරනු ලබන විධායක නිලධරයකුගේ මූලිකත්වයෙන් තිබිය යුතු අතර, එම ඒකකයට අදාල තාක්ෂණික දැනුම සහ අධිකරණමය විශේෂඥ දැනුම ඇති තැනැත්තන් ද ඇතුළුව ප්‍රවීන, පළපුරුදු සහ සුදුසුකම්ලත් විමර්ශකයන් ඊට ඇතුළත් විය යුතු ය.

**ඕ.එම්.පී. හි වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය.**

**18.** (1) ඕ.එම්.පී. හි වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශයක් තිබිය යුතු අතර, එම අංශය මගින් වින්දිතයන්ගේ, සාක්ෂිකරුවන්ගේ හා ඥාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු අතර එම තැනැත්තන්ගේ අවශ්‍යතා හා ගැටළු පිළිබඳව සොයා බැලිය යුතු ය.

(2) වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශයේ ප්‍රධානියා වශයෙන් ඕ.එම්.පී. විසින් විධායක නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

(3) ඕ.එම්.පී. සමග කටයුතු කරන වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ඉහත කී අංශය විසින් සියලු උචිත පියවර ගනු ලැබිය යුතු ය.

(4) වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය විසින් වින්දිතයන්ට, සාක්ෂිකරුවන්ට සහ අතුරුදහන් වූ තැනැත්තන්ගේ සුභසාධන සේවා හා ඥාතීන්ට මනෝ - සමාජීය සහාය ඇතුළු පරිපාලන සේවා සැලැස්වීමට හෝ සැලැස්වීමට පහසුකම් සැලසිය යුතු ය.

(5) ලබාදෙන ලද තොරතුරු භාවිත කරන ආකාරය පිළිබඳව හෝ අනාගතයේ දී භාවිත විය හැකි ආකාරය පිළිබඳව වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය විසින් වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) අවශ්‍ය අවස්ථාවල දී වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යායතන සමග සම්බන්ධීකරණය වී කටයුතු කළ හැකි ය.

IV කොටස

**මූල්‍ය**

මුදල්.

**19.** මේ පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ඕ.එම්.පී. ට පැවරී ඇති කර්තව්‍ය ඉටු කිරීම සඳහා එම කාර්යාලයට හැකිවන පරිදි ප්‍රමාණවත් අරමුදල් රජය විසින් එම කාර්යාලයට ලබා දිය යුතු ය. එම අරමුදල් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

ඕ.එම්.පී. හි සාමාජිකයන්ගේ වැටුප්.

**20.** ඕ.එම්.පී. සාමාජිකයන්ගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු අතර ඒවා ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය. එම සාමාජිකයන් ධුර දරන කාලය ඇතුළත එම වැටුප් අඩු නොකළ යුතු ය.

ඕ.එම්.පී. ය අරමුදල් උපයා ගැනීම.

**21.** දේශීය හෝ ජාත්‍යන්තර වශයෙන් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවන පරිදි ඕ.එම්. පී. හි අරමුණු ඉටු කර ගැනීම සඳහා අරමුදල් උපයා ගැනීමට ඕ.එම්.පී. ට බලය තිබිය යුතු ය.

මූල්‍ය වර්ෂය.

**22.** (1) ඕ.එම්.පී. හි මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ඕ.එම්.පී. හි ආදායම හා වියදම පිළිබඳ වත්කම් හා බැරකම් පිළිබඳව නිසි පරිදි ගිණුම් තැබීමට එම කාර්යාලය විසින් කටයුතු සැලැස්විය යුතු ය. ඕ.එම්. පී. හි ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු ය.

වාර්තා කිරීම.

**23.** 15 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ඕ.එම්.පී. ය විසින් ස්වකීය වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර ඒවා ප්‍රසිද්ධ කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

V කොටස

**සාමාන්‍ය විධිවිධාන**

වැරදි.

**24.** (1) (අ) ඕ.එම්.පී. විසින් නිකුත් කරන ලද දැන්වීමක් ප්‍රකාරව හේතුවක් නොමැතිව එම කාර්යාලයට පැමිණීම පැහැර හරින; හෝ

(ආ) ඕ.එම්.පී. විසින් යම් තැනැත්තකුගෙන් අසන ලද ප්‍රශ්නයකට හේතුවක් නොමැතිව පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ඇ) ඕ.එම්.පී. විසින් යම් තැනැත්තකු වෙත නිකුත් කරන ලද හෝ ඉදිරිපත් කරන ලද දැන්වීමක හෝ ලිඛිත නියමයක හෝ විධානයක ඇති නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන හෝ පැහැරහරින;හෝ

(ඈ) දැන්වීම් භාරදෙනු ලැබූ යම් තැනැත්තකු කැඳවීම ප්‍රකාරව තම සන්තකයේ හෝ පාලනය යටතේ ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් හේතුවක් නොමැතිව ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැරහරින; හෝ

(ඉ) මේ පනත යටතේ බලය පැවරී ඇති නිලධරයකු විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී එම නිලධරයින්ට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන; හෝ

(ඊ) ස්වකීය බලතල, වගකීම්, බැඳීම් සහ කාර්ය ඉටු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී දැන දැන ම ඕ.එම්.පී. ට හිරිහැර කරන හෝ බාධා කරන; හෝ

(උ) ඕ.එම්.පී. හි වැඩ කටයුතුවලට අනිසි ලෙස බලපෑම් කිරීමේ හෝ මැදිහත්වීමේ අරමුණ ඇතිව ක්‍රියා කරන;හෝ

(ඌ) ඕ.එම්.පී. සමග සහයෝගයෙන් ක්‍රියා කර ඇති හෝ සහයෝගයෙන් ක්‍රියා කිරීමට අදහස් කරන යම් තැනැත්තකු තර්ජනය කරන අඩත්තේට්ටම් කරන හෝ අනවශ්‍ය ලෙස බලපෑම් කරන නැතහොත් තර්ජනය කිරීමට අඩත්තේට්ටම් කිරීමට හෝ අනිසි ලෙස බලපෑම් කිරීමට උත්සාහ කරන; හෝ

(එ) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් රහස්‍ය තොරතුරු හෙළිදරව් කරන;හෝ

(ඒ) ඕ.එම්.පී. හි යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින;

යම් තැනැත්තකු ඕ.එම්.පී. හි අධිකාරි බලයට එරෙහිව අපහාස කිරීමේ වරදකට වරදකරු වන්නේ ය.

(2) ඕ.එම්.පී. ට අපහාස කිරීමේ වරදකට යම් තැනැත්තකු වරදකරු වී ඇති බව පෙනී යන අවස්ථාවක, එම කාර්යාලය විසින් එම කරුණ අභියාචනාධිකරණයට වාර්තා කළ යුතු ය. ඕ.එම්.පී. හි අධිකාරි බලයට එරෙහිව සිදු කරන ලද සෑම අපහාස කිරීමේ වරදක් සඳහා එම වරද අභියාචනාධිකරණයට එරෙහිව සිදු කරන ලද අපහාස කිරීමේ වරදක් ලෙස සලකා අභියාචනාධිකරණය විසින් ඒ සඳහා දඬුවම් පැමිණ විය යුතු ය.

නඩුවලින් ආරක්ෂා වීම.

**25.** (1) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව හෝ 140 වන ව්‍යවස්ථාව යටතේ වූ නීති කෘත්‍යවල දී හැර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ හෝ එහි සාමාජිකයකුගේ නිලධරයකුගේ හෝ සේවකයකුගේ කිසිම නියමයක් තීරණයක් ක්‍රියාවක් හෝ අත්හැරීමක් යම් නීති කෘත්‍යයක දී හෝ යම් අධිකරණයක් ඉදිරිපිට අභියෝගයට ලක් කළ නොහැකි ය.

(ආ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ හෝ එහි යම් සාමාජිකයෙකුගේ, නිලධරයකුගේ හෝ සේවකයකුගේ යම් නියමයකට තීරණයකට, ක්‍රියාවකට හෝ අත්හැරීමකට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව මගින් අභියාචනාධිකරණය වෙත පැවරී ඇති රිට් අධිකරණ බලය අභියාචනාධිකරණය විසින් නොව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (අ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධිකාරි බලයට එරෙහිව අපහාස කිරීම සම්බන්ධයෙන් හැර, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද නැතහොත් කිරීම අත්හරින ලද යම් ක්‍රියාවක් සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(ආ) මේ පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සද්භාවයෙන් ඉදිරිපත් කරන ලද වාර්තාවක්

සම්බන්ධයෙන් එම කාර්යාලයේ සාමාජිකයකුට එරෙහිව හෝ එම වාර්තාව පිළිබඳ සාරානුකූලව සත්‍ය විස්තරයක් පළකිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු පවරනු නොලැබිය යුතු ය.

(ඇ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට යම් තැනැත්තකු සද්භාවයෙන් සාක්ෂි හෝ ලේඛන ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එම තැනැත්තාට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීම නොකළ යුතු අතර ඒ සම්බන්ධයෙන් පරිපාලනමය ක්‍රියා මාර්ගයක් නොගත යුතු ය.

**26.** (1) ඕ.එම්.පී. විසින් මේ පනත යටතේ සාදනු ලැබීමට නියමිත රීති එම කාර්යාලය විසින් සාදනු ලැබිය හැකි ය. රීති.

(2) මේ පනත යටතේ සාදන ලද සෑම රීතියක්ම මාස තුනකට නොවැඩි සාධාරණ කාලයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**27.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ - අර්ථ නිරූපණය.

"අතුරුදහන් වූ තැනැත්තා" යන්නෙන්, යම් තැනැත්තකුගේ ඉරණම හෝ සිටින ස්ථානය සාධාරණ ලෙස නොදන්නා බවට විශ්වාස කරනු ලබන්නා වූ ද ඒ තැනැත්තා ගණනය නොවූ බවට සහ අතුරුදහන් වූ බවට සාධාරණ ලෙස විශ්වාස කරනු ලබන්නා වූ ද :—

(i) ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ සන්නද්ධ හමුදාවල සාමාජිකයකු හෝ පොලීසියේ සාමාජිකයකු ඇතුළු උතුරු නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර හෝ එහි ප්‍රතිඵලයක් ලෙස නැතහොත් එම සන්නද්ධ ගැටුම්වලට පසුව "යුද්ධයේ දී අතුරුදහන් වූ තැනැත්තකු" ලෙස හඳුන්වනු ලබන තැනැත්තකු ; හෝ

(ii) දේශපාලන නොසන්සුන්තාවයක් සම්බන්ධයෙන් හෝ සිවිල් කැරළි කෝලාහල සම්බන්ධයෙන්; හෝ

(iii) බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ සහ "සම්මුතියේ බලහත්කාරයෙන් අතුරුදන් කරවීම" යනුවෙන් අර්ථ නිරූපණය කර ඇත්තා වූ ද;

ඇති තැනැත්තකු අදහස් වේ,

අතුරුදන් වූ තැනැත්තන්ට අදාළව "අතුරුදන් වූ තැනැත්තාගේ ඥාතියා" යන්නට පහත දැක්වෙන තැනැත්තන් ඇතුළත් විය යුතු ය:—

(i) කලත්‍රයා;

(ii) දරුකමට හදාගත් ළමයින්, විවාහ නොවූ දෙමාපියන්ගේ ළමයින් හෝ සුළු දරුවන්;

(iii) (සුළු මව, සුළු පියා, දරුකමට හදා ගැනීමට ලබා ගත් තැනැත්තා ඇතුළු) දෙමාපියන්;

(iv) පූර්ණ හෝ අර්ධ සහෝදරයා හෝ සහෝදරිය නැතහොත් දරුකමට හදාගත් සහෝදරයන් හෝ සහෝදරියන්;

(v) නැන්දණිය/ මාමණ්ඩිය, මස්සිනා/ නෑනා, බෑණාවරුන් සහ ලේලිවරුන්;

(vi) මුණුබුරන් සහ මිණිබිරියන්;

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.